# සිංහල

## 5 ශ්‍රේණිය




Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## පියවර 8

- මනුක ඉගෙනගන්නා පාසලේ අධ්‍යාපනික ප්‍රදර්ශනයක් තිබුණා. ඒ පිළිබඳව මනුක ලියූ විස්තරයක් පහත දැක්වෙනවා. ඔබත් ඒ ලිපිය හඬනගා කියවන්න.

සෑම වර්ෂයක ම පැවැත්වෙන අධ්‍යාපන ප්‍රදර්ශනය මෙවර ද අප පාසලේ උත්සවාකාරයෙන් පැවැත්විණි. ඒ සඳහා ආසන්න පාසල් කිහිපයක් ම සහභාගි විය.ප්‍රදර්ශනයේ අවසාන දිනයේ කලා සන්දර්ශනයක් ද පවත්වන ලදී. පොත් ප්‍රදර්ශන කුටියක් ද එහි තිබුණු අතර සිසුන්ට අවශ්‍ය කරන විවිධ අධ්‍යාපනික ප්‍රකාශන මිලදී ගැනීමට ද අවස්ථාව සලසා තිබුණි. අවසාන දිනයේ දී අධ්‍යාපන වටිනාකමකින් යුත් විශේෂ දේශනයක් පැවැත්වීය. එම අවස්ථාවට සහභාගි වූ අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ප්‍රදර්ශනය සාර්ථක කරගැනීමට සහය දුන් සැමට ස්තුති කරමින් විශේෂ කතාවක් ද පැවැත්වී ය.

(ගුරු මාර්ගෝපදේශයෙන් උපුටා ගන්නා ලදී)

- ඉහත ඡේදයේ සඳහන් තාලුජ ‘ශ’ අකුරට පසුව දන්තජ ‘න’ යෙදුන වචන යටින් ඉරක් අඳින්න.

- ඉරි ඇඳි වචන ඔබගේ අභ්‍යාස පොතේ ලස්සනට ලියන්න.

## පියවර 9

- පහත දී ඇති වචන යොදා අර්ථවත් වැකි 5 ක් ගොඩ නගන්න.

ප්‍රදර්ශනය -..........................................................................................................

දර්ශනය - ..........................................................................................................

දේශන - ..........................................................................................................

ප්‍රශ්න - ..........................................................................................................

ප්‍රකාශනය - ..........................................................................................................

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.